සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Center R De Mazenod College Kandana 2025-04 45732

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "ඉඳ ඉඳ එක වෙහෙර..." යන කවියේ අවසාන පාදයෙන් කියැවෙන්නේ,
    1. දෙව්දත් හිමියන් පිළිබඳව ය. 2. ආනන්ද හිමියන් පිළිබඳව ය.
    3. සැරියුත් හිමියන් පිළිබඳව ය. 4. චුල්ලපන්ථක හිමියන් පිළිබඳව ය.
02. බුදු සසුනේ කාන්තාවන්ට පැවිදි බව ලබා ගැනීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,
    1. භද්දකච්චානා තෙරණියයි. 2. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි.
    3. උප්පලවණ්ණා තෙරණියයි. 4. ඛේමා තෙරණියයි.
03. බුදුරජාණන් වහන්සේගේ "එන්න, ඔබේ පැමිණීම ඉතා හොඳයි කියා ආගන්තුකයන් පිළිගන්නා අයෙකි" යන අදහස දැක්වෙන ආචාරශීලී ගුණාංගය හඳුන්වන්නේ,
    1. සඛිල යනුවෙනි. 2. සම්මෝදක යනුවෙනි.
    3. පුබ්බභාසී යනුවෙනි. 4. ඒහි සාගතවාදී යනුවෙනි.
04. භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය වැසිසළු, ගිලන් බෙහෙත්, ආගන්තුක බත් ආදිය අනුමත කරන ලද්දේ,
    1. ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීමකට ය. 2. විශාඛා සිටු දේවියගේ ඉල්ලීමකට ය.
    3. අනේපිඬු සිටුතුමාගේ ඉල්ලීමකට ය. 4. රජගහ නුවර සිටුවරයාගේ ඉල්ලීමකට ය.
05. සුබ නැකතකට අනුව අත්පොත් තැබීම හෙවත් දරුවෙකුට අකුරු කියවීම සිදුකරනු ලබනුයේ ඉපදී වසර,
    1. දෙකකිනි. 2. තුනකිනි 3. හතරකිනි. 4. පහකිනි.
06. නව අරහාදී ගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව වන්නේ,
    1. බුද්ධානුස්සති භාවනාවයි. 2. මෛත්‍රී භාවනාවයි.
    3. ආනාපානසති භාවනාවයි. 4. පිළිකුල් භාවනාවයි.
07. ගැරඬි කුණටත් වඩා දුගඳ යැයි පැරණි මිනිසුන් කීවේ,
    1. බොරු කීම ය. 2. සොරකම් කිරීම ය.
    3. ප්‍රාණඝාතය කිරීම ය. 4. සුරාපානය කිරීම ය.
08. කල්‍යාණ මිත්‍රයකු තුළ පැවතිය යුතු සතර බ්‍රහ්ම විහරණවලට අයිති නොවන්නකි,
    1. මෛත්‍රිය 2. කරුණාව 3. ශ්‍රද්ධාව 4. උපේක්ෂාව
09. උම්මග්ග ජාතකයෙන් ප්‍රකට වන ප්‍රමුඛතම බෝසත් ගුණය වන්නේ,
    1. වීර්යය යි. 2. කෘතවේදීත්වය යි. 3. ප්‍රඥා මහිමය යි. 4. ඉවසීම යි.
10. තමා බුදු දහම අගය කරන්නේ එම දහම තුළ කිසිවකු හිංසාවට පීඩාවට පත් කරන කිසිවක් නොමැති නිසා බව පැවසූ ලෝකප්‍රකට දාර්ශනිකයා වන්නේ,
    1. කාල් මාක්ස් ය. 2. බර්ට්‍රන්ඩ් රසල් ය. 3. ඇරිස්ටෝටල් ය. 4. ජීන් ජැක් රූසෝ ය.

- අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(සැරියුත්, දන්ත කුමරු, මල්ලිකා, පිළින්දවච්ඡ, දුටුගැමුණු, ශ්‍රී පාදස්ථානය, අජාසත්ත, කතරගම දේවාලය)

11. බෞද්ධ ජනතාව ........................................ වන්දනයේ යෙදෙන්නේ ශ්‍රද්ධාව පෙරටු කොටගෙන ය.
12. ........................................ මහරහතන් වහන්සේ මිනිසුන්ට වසලවාදයෙන් ආමන්ත්‍රණය කළ සේක.
13. පසේනදී කොසොල් මහ රජතුමාගේ අග බිසව වූයේ ........................................ බිසව ය.

14. ................................. මහරජතුමාගේ දායකත්වයෙන් ප්‍රථම ධර්ම සංගායනාව සිදු කරන ලදි.
15. හේමමාලා කුමරිය හා ................................. විසින් කිත්සිරිමෙවන් රජුගේ කාලයේ දී වම් දළදාව ලක්දිවට වැඩම කරන ලදි.

- පහත 16 සිට 20 තෙක් **A** තීරුවේ දැක්වෙන පිළිතුරට අදාළ විස්තරය **B** තීරුව හා ගළපා යා කරන්න.

| A | B |
|---|---|
| 16. දාඨාවංසය | යහපත් කරුණු තිස් අටක් විස්තර කෙරේ. |
| 17. අපරිහානීය ධර්ම | සංඝ භේදය ඇති කිරීමට හේතු විය. |
| 18. මහා මංගල සූත්‍රය | යහපත් ආචාර ධර්ම උගන්වා ඇත. |
| 19. සේඛියා | දළදා වහන්සේගේ ඉතිහාස කතාව ඇතුළත් වේ. |
| 20. පංචවර යාචනය | වජ්ජීන් විසින් අනුගමනය කොට ඇත. |

(ලකුණු 2 × 20 =40)

## II කොටස

- පළමු ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව <u>ප්‍රශ්න පහකට පමණක්</u> පිළිතුරු සපයන්න.

01. තෙවන වාරයේ පාසල් පාදක තක්සේරුව සඳහා ඔබ විසින් සිදු කරන ලද ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
    1. මෙම ඇගයීම සඳහා ඔබ යොදාගත් පාඩමේ නම කුමක් ද?
    2. මෙම ඇගයීම සිදු කිරීමට ඔබ රැගෙන ආ යුතු අනිවාර්ය ම දේ වූයේ කුමක් ද?
    3. ඇගයීම සිදුවන අතරතුර ගුරුවරයා ඔබට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.
    4. මෙම ඇගයීම සිදු කිරීමෙන් ඔබ දියුණු කරගත් කුසලතා දෙකක් ලියන්න.
    5. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.
    6. බෝසත් සිරිතේ හෝ බුදු සිරිතේ පරිසරය හා සම්බන්ධ සිදුවීම් දෙකක් ලියන්න.
    7. බුදුරජාණන් වහන්සේට සුජාතා සිටුදේවිය කිරිපිඬු දානය පූජා කළ ස්ථානය කුමක් ද?
    8. බුදුරජාණන් වහන්සේ තම මංගල ධර්ම දේශනාව සිදු කළේ කිනම් ස්ථානයක වැඩ සිටිය දී ද?
    9. දිවා රාත්‍රී පින් වැඩෙන පින්කම් දෙකක් ලියන්න.
    10. තුරුලතා සංරක්ෂණයට ඔබට කළ හැකි සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 2 × 10 =20)

02. 1. "යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්චා සෝ නප්පමජ්ජති..." යන ගාථාවේ ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.
    2. ඉහත ගාථාවේ තේරුම ලියන්න.
    3. ඔබට නිර්දිෂ්ට පෙළපොතේ සඳහන් ධම්මපද ගාථා දෙකෙන් ලබා දෙන උපදෙස් පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

03. 1. ත්‍රිවිධ රත්නයෙන් දෙකක් ලියන්න.
    2. දහම් ගුණ කියැවෙන පාලි ගාථා පාඨය නිවැරදි ව ලියා දක්වන්න.
    3. ධර්මරත්නය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

04. 1. ගෞතම බුදු සසුනේ අගසව් දෙනමගේ නම් ලියන්න.
    2. උන්වහන්සේලා සතුව පැවති විශේෂ ගුණාංග තුනක් ලියන්න.
    3. ඉන් එක් තෙරුන් වහන්සේ නමක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2+3+5 = 10)

05. 1. බුදු දහමෙහි 'කර්මය' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
    2. සත්ත්වයා කර්ම රැස් කරන දොරටු තුන නම් කරන්න.
    3. හිරි - ඔත්තප්ප ඇති ඔබ විසින් නොකළ යුතු ක්‍රියා පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

06. 1. ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතරක් පිළිබඳ ව දේශනා කළ සූත්‍රය කුමක් ද?
    2. බුද්ධ දේශනාවෙහි සඳහන් නොකළ යුතු වෙළඳාම් පහෙන් තුනක් ලියන්න.
    3. ධාර්මික රැකියාවන්හි නිරත වීමෙන් ලැබෙන ප්‍රතිලාභ පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න. (ලකුණු 5+5 = 10)
    1. ගෘහ ප්‍රවේශ මංගල්‍යය
    2. බුදුගුණ භාවනාව වැඩීම
    3. දණ්ඩක ප්‍රශ්නය
    4. සහජීවනය